**HRD KOREA**
**EPS Center in Sri Lanka**

# සාර්ථකත්වයේ තේමාව රැගත් පරිශීලික නිර්මාණ අන්තර්ගතයන් ඇතුලත් තරඟාවලිය 2017

## -SUCCESS STORY - UCC [USER CREATED CONTENTS] COMPETEION 2017-

**කොරියාවෙහි සේවය නිම කර නැවත මව් බිමට පැමිණි ඔබ සදහා....**

කොරියානු රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ, කොරියානු සේවා කාලය සාර්ථක ලෙස අවසන් කරමින් ශ්‍රී ලංකාවට පැමිණි ඔබ සඳහා, සාර්ථකත්වයේ තේමාව රැගත් පරිශීලික නිර්මාණ අන්තර්ගතයන් ඇතුලත් (UCC- User Created Contents) තරඟාවලියක් පැවැත්වීමට කොරියානු මානව සම්පත් සංවර්ධන සේවා ආයතනය කටයුතු සම්පාදනය කර ඇත.

තරඟාවලිය පිළිබඳ කාල සටහන

- තරඟාවලිය පිළිබඳ පූර්ව නිවේදනය : 2017, අප්‍රේල් 20
- අයදුම්පත් භාර ගැනීමේ කාල සීමාව : 2017, අප්‍රේල් 24 සිට 2017, මැයි 19
- නිර්මාණ ඇගයීම : 2017, මැයි 23
- ප්‍රථිඵල නිවේදනය : 2017, මැයි 25
- වීඩියෝව නිර්මාණය සදහා  පටිගත කිරීමේ ආරම්භක දිනය : 2017, අප්‍රේල් 20
- තරඟය සදහා අදාල ක්ෂේත්‍රයන් සහ අනුගමනය කල යුතු කරුණු : පහත දක්වා ඇති උපදෙස් අනුගමනය කල යුතුය.

※ කා සඳහාද :

➤කොරියානු රැකියා ආගමනයෙන් පසු තමන්ගේම ව්‍යාපාරයක නිරත වන (දැනට ව්‍යාපාර කටයුතු වල සාර්ථක ලෙස නිරත වන),

➤තම මව් බිමෙහි කොරියානු සේවා යෝජකයකු හෝ වෙනත් ආයතනයක් සදහා සාර්ථක ලෙස තම සේවා දායකත්වය ලබා දෙන,

ඔබ සදහා....

※ භාර දිය යුතු අයිතමයන් :

- පරිශීලක නිර්මාණ අන්තර්ගතයන් සහිත වීඩියෝ පටය (UCC-User Created Contents)
- ඇමුණුම් 2 සහ 3 : පරිශීලික නිර්මාණ (UCC- User Created Contents) තරඟ අයදුම්පත සහ වීඩියෝ පට නිර්මාණ අන්තර්ගතය සහ නිර්මාණ අයිතිය තමන් සතු බවට ප්‍රකාශ වන දිවුරුම් ප්‍රකාශය
- මෙම සියලුම දෑ එක්වර භාර දිය යුතු අතර එක් තරඟකරුවකුට ඉදිරිපත් කල හැක්කේ එක් නිර්මාණයක් පමණි (ඔහුගේ/ඇයගේ සාර්ථකත්වය ආශ්‍රිතව නිර්මාණය කරන ලද කෙටි සිනමා පටය)

- පරිශීලික නිර්මාණ (UCC- User Created Contents) සඳහා ඇතුළත් විය යුතු කරුණු....

සෑම නිර්මාණයක්ම පහත කරුණු ආශ්‍රිත පැහැදිලි තේමාවක් මත නිම විය යුතුය.

- ➢ ඔබ කොරියාවෙහි නිරත වූ රැකියාවෙහි ස්වාභාවය (රැකියාවෙහි මුහුණ දුන් අපහසුතා, ධනාත්මක පසුබිම..... ආදී කරුණු)
- ➢ රැකියාවෙහි සාර්ථකභාවය (මෙරටට පැමිණි පසු) වත්මත් රැකියාවෙහි ස්වාභාවය...
- ➢ තමන්ගේම සාර්ථක ව්‍යාපාරයක් ඇත්නම් එම ව්‍යාපාරය ස්ථාපිත කල ආකාරය, සාර්ථකත්වය කරා ළඟා වූ ආකාරය සහ වත්මන් තත්වය...

කතාව ගොඩනැගීම සඳහා උපයෝගී කරගත හැකි අතිරේක අන්තර්තයන්

උදාහරණ:

a. ඔබ කොරියානු රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ සේවය කරන කාලය තුළ කොරියානු රජය සහ කොරියානු මානව සම්පත් සංවර්ධන සේවා ආයතනය මඟින් නොමිලේ පවත්වනු ලැබූ සම්මන්ත්‍රණ / වැඩමුළු වලට සහභාගි වීමට ඔබට අවස්ථාව උදා විය. ඔබ ලංකාවට පැමිණි විගස ඔබට එම සම්මන්ත්‍රණ/ වැඩමුළු මඟින් ලබාගත් දැනුම සහ කුසලතා තුලින් ඔබගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හැකි විය.

b. ඔබ කොරියානු රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ සේවය කරන කාලය තුළ ඔබගේ රැකියා ස්ථානයේ දී කුසලතා (නිදසුන් : පෑස්සුම්, වීදුරු කැපීම, වයර් ස්ථාපිත කිරීම ආදිය) සහ තාක්ෂණික ශිල්ප පිළිබඳ දැනීමක් ලබා ගන්නා ලදී. ඔබ ලංකාවට පැමිණි විගස, ඔබ ලබාගත් දැනුම, කුසලතා සහ තාක්ෂණික ශිල්ප ඔබගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ ලංකාවෙහි හෝ වෙනත් රටක රැකියාවක් ලබාගැනීමට උපකාරී විය.

c. මෙම තරඟය සඳහා සහභාගි වන සෑම තරඟකරුවකුම මෙම තරඟයට සහභාගී වීමට තීරණය කිරීමට හේතුව සඳහන් කල යුතුය.

- අවශ්‍ය නම් දැනට කොරියාවේ සේවයෙහි නියුතු ඔබගේ මිතුරන් වෙත ලබා දිය හැකි උපදෙස් සඳහන් කරන්න.

※ ඔබගේ UCC නිර්මාණය/ වීඩියෝව (සාර්ථකත්වයේ තේමාව රැගත් වීඩියෝ නිර්මාණය) වත්මනෙහි කොරියාවෙහි සේවයේ නිරත වන්නන් හට එහි සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ලබා දීමට, රැකියා ස්ථානයන්ට හැඩ ගැසීමට, එමෙන්ම නැවත ලංකාවට පැමිණි පසු සාර්ථකත්වය කරා ළඟා වීමට උපකාරී වන පරිදි ධනාත්මක සිතුවිලි වලින් පරිපූර්ණ ලෙස සැකසිය යුතුය.

- UCC /වීඩියෝවට අදාළ කොන්දේසි :

※ වීඩියෝ ආකෘතිය සහ කාල සීමාව :

- ඔබට විනාඩි 05 කට නොවැඩි කාල සීමාවකට අදාල කෙටි චිත්‍රපටයක් නිර්මාණය කල හැක. ඔබට ස්මාට් දුරකථන, Cam-Coder, ඩිජිටල් කැමරා, වීඩියෝ පටිගත කරන උපකරණ ආදිය භාවිතා කල හැක.

- මුල් වීඩියෝ පටය සහ දිවුරුම් ප්‍රකාශය එක්වර ඉදිරිපත් කළ යුතුය.
- (1280 x 720 ට වැඩි pixel, රාමුව 29.27, ස්වර සම්ප්‍රේෂණ අනුපාතය 192Kbps ට වඩා වැඩි, ස්වර නියැදි වේගය 44Khz, avi, mp4, wmv, mov ගොනු ආදිය

HD ආකෘතිය වඩාත් යෝග්‍ය වනු ඇත

- ධාරිතාව: 750MB ට වඩා අඩු

**※ ඉදිරිපත් කිරීමේ ක්‍රමය:**

තැපෑලෙන් (තැපැල් කාර්යාලය/ භාණ්ඩ බෙදාහැරීම), CD මගින් හෝ ශ්‍රී ලංකා EPS මධ්‍යස්ථානයට පැමිණ භාර දීමෙන්

※ ත්‍යාග :

ප්‍රථම ස්ථානය සඳහා : වොන් 300,000.00 ක් සහ කොරියානු සංචාරය
දෙවන ස්ථානය සඳහා : වොන් 200,000.00
තෙවන ස්ථානය සඳහා : වොන් 100,000.00

ජයග්‍රාහක වීඩියෝ පට 03 ක් ශ්‍රී ලංකා EPS මධ්‍යස්ථානය මගින් තෝරා ගනු ලබන අතර ඔවුන් හට ත්‍යාග මුදල් සහ ඊට අදාළ ප්‍රකාශයන් ලබා දෙනු ඇත.

සාමාන්‍ය කොන්දේසි:

* ප්‍රථම ස්ථානය දිනා ගත් ජයග්‍රාහකයාගේ වීඩියෝ පටය කොරියාවෙහි සේවය නිම කර නැවත පැමිණෙන්නන් ඒ සඳහා සූදානම් කිරීමේදී ඉදිරිපත් කිරීමට සහ කොරියාවෙහි සේවය නිම කර නැවත පැමිණෙන්නන් සඳහා ඇති රැකියා වෙබ් අඩවිය ආදිය සඳහා භාවිතා කරනු ඇත.
* ජයග්‍රාහකයාගේ වීඩියෝ පටය, කොරියාවෙහි සේවය නිම කර නැවත පැමිණෙන්නන් සඳහා ඇති රැකියා වෙබ් අඩවියෙහි පල කිරීමට පෙර සංස්කරණය (ගුණාත්මක බව) කරනු ඇත.
* පේටන්ට් බලපත්‍ර ලබා ඇති වීඩියෝ පට සහ එවායේ අන්තර්ගතයන් (රූප සහ සංගීත) භාවිතා කිරීම සම්පූර්ණයෙන් තහනම් වේ.
* අයදුම්පත් ඉදිරිපත් කිරීම නිරීක්ෂණය (සම්මතයට අනුව) කරනු ඇත.
* උපදෙස් අනුගමනය නොකරන අයදුම්කරුවන් සහ තරග නීති උල්ලංඝනය කරන අයදුම්කරුවන් තරගයට ඇතුලත් කර ගනු නොලැබෙනු ඇත.

අවසන් වටය සඳහා යෝජනා වීමට, ඔබගේ චිත්‍රපටය නරඹන්නන් දිරිමත් වන අයුරින් නිර්මාණශීලීත්වයෙන් පිරිපුන් විය යුතුය.

වැඩි විස්තර සඳහා 0112886945 අංකය ඔස්සේ කොරියානු මානව සම්පත් සංවර්ධන සේවා ආයතනයේ ශ්‍රී ලංකා EPS මධ්‍යස්ථානය අමතන්න.

ශ්‍රී ලංකා EPS මධ්‍යස්ථානය
171/4, ප්‍රධාන වීදිය
බත්තරමුල්ල
0112 886945
විද්‍යුත් තැපැල් : epscenterlk@yahoo.com

# පරිශීලික නිර්මාණ (UCC- User Created Contents) තරඟය 2017 අයදුම්පත

<table>
<tr><td rowspan="3">අයදුම්කරුගේ තොරතුරු</td><td>නම සහ ආයතනය</td><td>නම</td><td></td><td>ආයතනය</td><td></td></tr>
<tr><td>ලිපිනය</td><td colspan="2"></td><td rowspan="2">දුරකථන අංක</td><td>ස්ථාවර</td></tr>
<tr><td>විද්‍යුත් තැපෑල</td><td colspan="2"></td><td>ජංගම</td></tr>
<tr><td rowspan="5">නිර්මාණය පිළිබඳ විස්තරය<br><br>(පරිශීලික නිර්මාණ (UCC- User Created Contents) සාර්ථකත්වයේ තේමාව රැගත් කථා පුවත සම්බන්ධ අන්තර්ගත තොරතුරු)</td><td>මාතෘකාව</td><td colspan="4"></td></tr>
<tr><td>තේමාව</td><td colspan="4"></td></tr>
<tr><td>කාල සීමාව</td><td colspan="4">සම්පූර්ණ වීඩියෝව මිනිත්තු තත්පර</td></tr>
<tr><td>තරඟයට සහභාගි වීමට හේතුව</td><td colspan="4"></td></tr>
<tr><td>අන්තර්ගතය</td><td colspan="4"></td></tr>
</table>

(භාරදියයුතු ලියකියවිලි සහ සටහන්)

- ලියාපදිංචිය සඳහා : අයදුම්පත, වීඩියෝ පටය
- නොවැලැක්විය හැකි හේතු මත නිර්මාණ වලට අදාල කාල සටහන වෙනස් වීමේ හැකියාවක් ඇති අතර ඒ සම්බන්ධයෙන් නිවේදනය කරනු ඇත
- පුද්ගලික තොරතුරු සත්‍ය හා නිවැරදි විය යුතු අතර අසම්පූර්ණ අයදුම්පත් සහිත නිර්මාණ තරඟයෙන් ඉවත් කරනු ඇත
- වැඩි විස්තර සඳහා 0112886945 අමතන්න

ඉහත ප්‍රකාශිත පරිදි පරිශීලික නිර්මාණ : UCC- User Created Contents තරඟය 2017 සඳහා EPS පද්ධතිය යටතේ සේවය සාර්ථකව නිම කර මව් බිමට පැමිණි සේවකයකු ලෙස තරඟයට සහභාගි වන අතර මේ සමග තරඟ වීඩියෝ පටය සහ නිර්මාණ සම්බන්ධ දිවුරුම් ප්‍රකාශය අමුණා ඇත.

ඇමුණුම් : (1) වීඩියෝ පටය ( CD, DVD, වෙනත්)

--------------------------------------------

මුද්‍රිත නම සහ අත්සන (නමට ඉහලින් අත්සන යොදන්න)

දිනය (අවුරුද්ද/මාසය/දිනය)----------------------------

# පරිශීලික නිර්මාණ (UCC- User Created Contents) තරඟය 2017
# (ආරාධිත දේශනය සහ නිර්මාණ සම්බන්ධ දිවුරුම් ප්‍රකාශය)

1. සියලුම ඉදිරිපත් කරනු ලබන නිර්මාණයන්, මීට ඉහතදී ප්‍රකාශයට පත් නොකළ නිර්මාණ විය යුතු වන අතර වීඩියෝ පටය නිර්මාණය බුද්ධිමය දේපළ අයිතිවාසිකම් වලට අනුව සියලු වගකීම් වලින් නිදහස් විය යුතු බවට ප්‍රකාශ කරමින් ඔබ ඉදිරිපත් කරනු ලබන නිර්මාණයට වගකියන බවට ප්‍රතිඥා දීම.

   ※ කොරියානු ජනරජය සහ හිමිකම් උල්ලංඝනය කිරීමට එරෙහිව පවතින නීතී ඔබගේ මව් රටට හෝ නිර්මාණය ඉදිරිපත් කළ රටටද අදාළ වේ. ප්‍රථම ස්ථානය දිනාගත් ජයග්‍රාහකයාගේ තරඟ ප්‍රතිඵල ඔහු හෝ ඇයගේ නිර්මාණයක් නොවන බවට තහවුරු වුවහොත් තරඟයෙන් නුසුදුස්සකු වේ.

   ※ ප්‍රවර්ධන අයිතමය කොරියානු ජනරජයේ ගුවන් විදුලි සමාලෝචන ප්‍රතිපාදන යටතට අයත් වේ. ('14.12.30)

2. ප්‍රථම ස්ථානය දිනා ගත් ජයග්‍රාහකයාගේ වීඩියෝ පටය කොරියානු මානව සම්පත් සංවර්ධන සේවා ආයතනය විසින් ව්‍යාපාර කටයුතු මත යොදා ගන්නා අතර ඒ සඳහා කොරියානු මානව සම්පත් සංවර්ධන සේවා ආයතනයට මාගේ පූර්ණ අවසරය ලැබෙන අතර පහත දැක්වෙන දෑ කිරීමටද බලය ඇතः වෙනස් කිරීමට, වැඩි දියුණු කිරීමට සහ සංස්කරණය කිරීමට සහ එහි අන්තර්ගතයන් ප්‍රවර්ධන හේතුන් සඳහා යොදා ගැනීමට.

3. ----------------------------------------------------(සම්පූර්ණ නම සටහන් කරන්න) 2017 පරිශීලක නිර්මාණ (UCC) තරඟාවලියෙහි ජයග්‍රාහක ලෙස සහ ආරාධිත දේශක ලෙස කොරියානු මානව සම්පත් සංවර්ධන සේවා ආයතනයෙහි සියලුම නීති රීති රෙගුලාසි සහ කරුණු වලට එකඟ වෙමි.

4. වීඩියෝ නිර්මාණයෙහි සිදුකරන වෙනස්කම් පිළිබඳ (වෙනස් කිරීම්, එකතු කිරීම්, සහ ප්‍රචාරණය) මාගේ කිසිඳු විරෝධයක් නොමැති අතර කිසිදු ප්‍රශ්න කිරීමක් ඉදිරියේදී සිදු නොකරන බවද ඉහත සඳහන් සියළුම කරුණු කියවා අවබෝධ කරගත් බව මින් තහවුරු කරමි.

--------------------------------------------

මුද්‍රිත නම සහ අත්සන (නමට ඉහලින් අත්සන යොදන්න)

දිනය (අවුරුද්ද/මාසය/දිනය)----------------------------

ඇමුණුම් 2